# ආනයනික භාණ්ඩ පරීක්ෂා කිරීමේ වැඩ පිළිවෙල

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන ආනයනික භාණ්ඩ පරීක්ෂා කිරීමේ වැඩ පිළිවෙලට අනුව දැනට භාණ්ඩ 102 ක් තත්ත්වය පරීක්ෂාවට ලක් කෙරේ. මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරනු ලබන්නේ 1969 දී නිකුත් කරන ලදුව 1987 දී සංශෝධන කරනු ලැබූ ආනයන හා අපනයන (පාලනය කිරීමේ) පණතට අනුව නිකුත් කරන ලද රෙගුලාසි වලට අනුවය. 2006-06-01 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1447/28 දරණ අති විශේෂ ගැසට් නිවේදනයෙන් නිකුත් කරන ලද ආනයන (ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන) 2001 රෙගුලාසිය මේ සඳහා අදාල වන අතර නම් කරන ලද ආනයනික භාණ්ඩ අදාල ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූල වන්නේද යන වග මෙම වැඩ පිළිවෙලට අනුව සොයා බලනු ලැබේ. (2001-09-28 දින අංක 1203-29 දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ පළකරන ලද ආනයන (ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන) රෙගුලාසි හා ඒ සඳහා නිකුත් කරන ලද සංශෝධන මෙම රෙගුලාසිය මගින් අහෝසි කෙරේ.

මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී බඩු තොග පහත අන්දමට ප්‍රභේද කිහිපයකට වෙන් කරනු ලැබේ.

**ප්‍රභේද 1**

පිළිගත් සහතිකයක් සහිත විදේශීය රසායනාගාරයක් විසින් හෝ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග අවබෝධතා ගිවිසුමකට පිවිසි පරීක්ෂා කිරීමේ ආයතනයක් විසින් නිකුත් කරන ලද තත්ත්ව සහතිකයක් සහිත බඩු තොග

**ප්‍රභේද 2**

අපනයනය කරන රටෙහි ජාතික ප්‍රමිති ආයතනය මගින් තත්ත්ව සහතිකයක් නිකුත් කරන ලද බඩු තොග

**ප්‍රභේද 3**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් ලියා පදිංචි කරන ලද නිෂ්පාදනාගාරයක් තුල නිපදවන ලද, අදාල භාණ්ඩ ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල වන බවට එම නිෂ්පාදනාගාරයෙන් නිකුත් කරන ලද තත්ත්ව සහතිකයක් සහිත බඩු තොග

## ප්‍රභේද 4

අපනයන කරන රටේ භාණ්ඩ සහතිකය සහිත භාණ්ඩ වලින් යුත් බඩු තොග

(මෙහිදී අදාළ ශ්‍රී ලංකා ප්‍රමිතියත්, අපනයනය කරන රටෙහි ජාතික ප්‍රමිතියත් එකිනෙකට සමාන විය යුතුය. ප්‍රමිති දෙකෙහි දෙන ලද අවශ්‍යතා සම්පූර්ණයෙන් ගැලපේ නම් ,තත්ත්ව සහතිකයක් ඉදිරිපත් කිරිම අවශ්‍ය නොවේ. යම්කිසි හෙයකින් අදාල අවශ්‍යතා ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රමිතිය සමග නොගැලපේ නම්, එම නොගැලපෙන අවශ්‍යතාවයන් සඳහා තත්ත්ව සහතිකයක් ඉදිරිපත් කිරිම අවශ්‍ය වේ.)

## ප්‍රභේද 5

ඉහත සඳහන් ප්‍රභේද එකකටවත් අයත් නොවන බඩු තොග

ප්‍රභේද 1 සිට 4 දක්වා ගණයට අයත් බඩු තොග, තත්ත්වය සහතික කරන ලද බඩු තොග ලෙස සලකා නියැදි කිරිමකින් තොරව විකිණීමට/භාවිතය සඳහා අනුමත කරන අතර, අහඹු ලෙස තෝරාගනු ලබන බඩු තොග නියැදි පරීක්ෂාවට ලක්කරනු ලබයි. නියැදි ලබාගත් පසු බඩු තොග විකිණීම/භාවිතය සඳහා මුදා හැරේ. (පරික්ෂා ප්‍රතිඵල ලැබෙන තෙක් බඩු තොගය තබා ගැනීම අවශ්‍ය නොවේ) නමුත් භාණ්ඩවල තත්ත්වය පිළිබඳ යම් හෝ සාධාරණ සැකයක් ඇති වූ විටක, බඩු තොග විකිණීම/භාවිතය සඳහා නිදහස් කිරීම කරනු ලබනුයේ තොගයෙන් ලබා ගන්නා නියැදි අදාල ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල බවට තහවුරු වීමෙන් අනතුරුවය.

5වන ප්‍රභේදයට අයත් බඩු තොග වලින්, වරායේදීම නියැදි ලබාගනු අතර පරීක්ෂණ වාර්තා ලැබෙන තෙක්, එම බඩු තොගය වරායේම තබාගත යුතුවේ . මෙම බඩු තොග විකිණීමට /භාවිතයට මුදා හැරීම පිළිබඳ තීරණය ගනුයේ පරීක්ෂණ ප්‍රතිඵල වලට අනුවය. පහසුකම් ඇති අවස්ථාවල මෙම තොග, රේගු බාරයේ ඇති ගබඩාවකට නිදහස් කිරිම කරනු ලබයි.